
# Project 90
# 90 වන ව්‍යාපෘතිය



DP EDUCATION

## Coding School




LIVEWORKSHEETS

❖ චිත්‍රපටි සොයාගැනීමට app එකක් Search bar එක තුළ movie එකක නමක් search කළ විට එහි විස්තර පෙන්වීට නිර්මාණය කරමු.

❖ App lab එක තුළ නිර්මාණය කරන මෙම App එකේ ඇතුළත් Home හා Movie ලෙස screen හා Movies ලෙස data table එක ඔබ වෙත design කර ඇත.


❖ පහත ඇති button එක මත click කර data table එක download කරගන්න.

Data table එක download කරගැනීමට මේ මත click කරන්න.


❖ එවිට පහත ආකාරයේ google drive tab එකක් ඔබගේ browser එක තුළින් open වේ. එහි ඇති download button එක click කර file එක download කරගන්න.





❖ පහත දක්වා ඇත්තේ එසේ download කරගන්නා table එක app එකට add කරගන්නා ආකාරයයි.




LIVEWORKSHEETS




- Home screen එකේ ඇති input text box එක තුළ type කරන වචනය database එකේ search කිරීමට search button එක මත click කරන්න.

- එසේ click කළ විට සිදු වෙන දේ නිර්මාණයට code කරමු.

- input text box එක තුළ type කළ වචනය store කරගැනීමට මුලින්ම variable එකක් නිර්මාණය කරගන්න. `var movieTitle = "";`


- ඉන්පසු search button එක මත click කළ විට පහත ආකාරයට search කිරීමට ඇතුළත් කරන ලද වචනය නිර්මාණය කරගත් variable එකට ගබඩා කරමු.

LIVEWORKSHEETS

toLowerCase() function එක මඟින් input කරන text එකේ සියලු අකුරු simple අකුරු බවට පත් කරයි.




❖ ඉන්පසු data table එක පිළිබඳව බලමු. Data table එක බැලීම සඳහා data tab එකට යන්න. එහි ඔබ ඉහතදී import කරගත් movies data table එක දිස්වේ.





❖ Movies data table එක මත click කර එය විවෘත කර බැලිය හැකිය.

❖ දැන් මෙම table එකේ දත්ත භාවිතා කර search කරන movie එක පිළිබඳව විස්තර පෙන්වන ආකාරයට නිර්මාණය කරගමු.


❖ Data table එකේ ඇති data read කිරීම සඳහා toolbox එකේ data section එකේ ඇති readRecords නැමැති block එක යොදාගන්න.

❖ එය drag කර drop කරගත් පසු පහත ආකාරයට code blocks කිහිපයක් නිර්මාණය වේ.





මෙහි මෙම රතුපාටින් දක්වා ඇති කොටස ඉවත් කරගන්න. ඉන්පසු "mytable" නැමැති ස්ථානයට අපගේ data table එකේ නම වන "Movies" යන නම ලබා දෙන්න.

LIVEWORKSHEETS




එවිට මේ ආකාරයට දර්ශණය විය යුතුය.


❖ දැන් for loop එක තුළ code කිරීමට පටන්ගන්න.




❖ recordsLc ලෙස නව variable එකක් නිර්මාණය කරගන්න. එහි අගය ලෙස (records[i].Title).toLowercase ලබා දීමෙන් සිදු වන්නෙ data table එකේ ඇති i වන record එකේ Movie Title එක simple අකුරින් variable එකේ ගබඩා වීමයි. i සඳහා අගය ලැබෙන්නේ for loop එකෙනි.




❖ එසේ එම variable එකට ගබඩා කරගන්නා title එක input text box එක තුළට ඇතුළත් කරනා text එකට සමාන දැයි බලා සමාන නම් එම record[i] එකේ Title එක Movie screen එකේ ඇති “lblTitle” නැමැති label එකට set කරයි.




❖ ඒ ආකාරයෙන්ම එම record එකේ ඇති image url එක භාවිතා කර imgOfSearchedMovie නැමැති design එකේ ඇති image එකේ url එකට set කරයි.

LIVEWORKSHEETS

```
setImageURL("imgOfSearchedMovie", records[i].Image);
```

- මේ ආකාරයට genre, ratings හා year of released වලට අදාළ label සඳහාද පහත පරිදි data set කරයි.

```
setText("lblGenre", records[i].Genre);
setText("lblRatings", records[i].Ratings);
setText("lblYOReleased", records[i].YearOfReleased);
```

- Search කරනා වචනය data table එකේ අඩංගු නොවේ නම් පහත පරිදි else block එක තුළ try again ලෙස පෙන්වන්න.

```
}
else{
  setText("text_input1", "");
  setProperty("text_input1", "placeholder", "Try Again");
}
```

- සම්පූර්ණ codes පහත දක්වා ඇත.

```
var movieTitle = "";
onEvent("btnSearch", "click", function( ) {
  movieTitle = getText("text_input1").toLowerCase();
  readRecords("Movies", {}, function(records) {
    for (var i =0; i < records.length; i++) {
      var recodsLc = records[i].Title.toLowerCase();
      if(recodsLc == movieTitle)
      {
        setScreen("Movie");
        setImageURL("imgOfSearchedMovie", records[i].Image);
        setText("lblTitle", records[i].Title);
        setText("lblGenre", records[i].Genre);
        setText("lblRatings", records[i].Ratings);
        setText("lblYOReleased", records[i].YearOfReleased);
      }
      else{
        setText("text_input1", "");
        setProperty("text_input1", "placeholder", "Try Again");
      }
    }
  });
});
```

LIVEWORKSHEETS

- නිවැරදි පිළිතුර තෝරන්න
    1. Search box එක තුළට ඇතුලත් කරන text එක සම්පූර්ණයෙන්ම capital අකුරු ලෙස movieTitle variable එකට දමාගත යුතු නම් නිවැරදි code එක කුමක් ද?

```
movieTitle = getText("text_input1").toUpperCase();
```

```
movieTitle = movieTitle.toUpperCase();
```

```
movieTitle = getText("text_input1").toCapitalCase();
```

2. 
```
readRecords("Movies", {}, function(records) {
```
මෙම code එකේ ඇති “Movies” ලෙස නම් කර ඇත්තේ,

App එකේ නම වේ.

Variable එකක නමක් වේ.

භාවිතා කරනා data table එකේ නම වේ.

3. ඉහත ආකාරයට සම්පූර්ණ App එක නිර්මාණය කළ විට එහි ඇති for loop එක run වන වාර ගණන තීරණය වන්නේ කුමකින් ද?

Data table එකේ ඇති records ප්‍රමාණය අනුව.

Record එකක දිග අනුව.

Records වල ඇති column ගණන අනුව.

LIVEWORKSHEETS

4. Ratings වල අගය 10න් භාගයක් ලෙස දැක්වීමට අදාළ නිවැරදි block එක කුමක් ද?

```
setText("lblRatings", records[i].Ratings / "/10");
```

```
setText("lblRatings", records[i].Ratings * 10);
```

```
setText("lblRatings", records[i].Ratings + "/10");
```

5. ඉහත නිර්මාණය කළ App එකේ Back button එක design කර තිබුණද එහි ක්‍රියාකාරීත්වය සඳහා code කර නොමැත. ඒ සඳහා නිවැරදි code block set එක කුමක් ද?

```
onEvent("btnBack", "click", function( ) {
  setScreen("Home");
});
```

```
onEvent("btnBack", "keyup", function( ) {
  setScreen("Home");
});
```

```
onEvent("btnBack", "click", function( ) {
  setScreen("Movie");
});
```

LIVEWORKSHEETS